# ගරු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාගේ පණිවුඩය



තෙමසකට වරක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පල කරන ගොවිකම් සඟරාව රටේ ඇති ජනප්‍රිය සඟරාවලින් එකකි. පසුගිය අවුරුදු හැටක් තරම් වන දිගු කාලයක් මෙම සඟරාව පළ වී ඇති අතර ගොවි ජනයා අතර නවීන ගොවිතැන් ක්‍රම ව්‍යාප්ති කිරීමෙහිලා විශාල සේවයක්ද එමගින් ඉටු වී ඇත. මෙම සඟරාවෙහි හැටවෙනි අනුස්මරණ කලාපයට පණිවුඩයක් එවීමට හැකිවීම සම්බන්ධයෙන් මම ඉතා ප්‍රීතිවෙමි.

සවාධීන ජාතියක් ලෙස 19 වසරක් ජීවත් වී ඇති අපට ආර්ථික නිදහසද අත්‍යවශ්‍යයය. වැඩි වැඩියෙන් ආහාර වර්ග වගා කොට රටට අවශ්‍ය ආහාර අප විසින් රට තුළම නිපදවා ගැනීම මෙම ආර්ථික නිදහස ලඟා කර ගැනීමේ එක මඟකි. මේ සඳහා රජය මගින් නිසි විධිවිධාන හා සැළැස්ම යොදා ඇති මුත් ඒවා ක්‍රියාත්මක කිරීමත් පතල කිරීමත් රඳා පවතින්නේ පොදු ජනයාගේ අතෙහිය. මෙකී අදහස් හා අරමුණු පොදු ජනයා අතර පතළ වූ තරමටම එකී අරමුණුවල් ඉටු වේ යැයි විශ්වාස කළ හැක.

වැඩි වැඩියෙන් අස්වැන්න නෙළා ගැනීම උදෙසා නවීන ගොවිතැන් ක්‍රම ක්‍රියාවේ යෙදිය යුතු වෙයි. නවීන ක්‍රම පතළ කිරීම උදෙසා ගොවිකම් සඟරාව වැනි ප්‍රකාශන අවශ්‍යය. එබැවින්, අතීතයේ මෙන්ම අනාගතයේදීත් ගොවිකම් සඟරාවෙන් රටට සේවයක් සැලසේයයි බලාපොරොත්තු වෙමි.

ඇම්. ඩී. බණ්ඩා,
කෘෂිකර්ම හා ආහාර ඇමති.